Prepared by- ඩයනා පුෂ්පරාණී මිය

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

**5.3 නර්තන ශිල්පීන් අගයමු.**

එස්.පනීභාරත මහතා.



උපත - **1920.02.24** හතර කෝරළයේ අල්ගම ග්‍රාමයේ දී.

කුඩා කල සිටම උඩරට නර්තනය සහ උඩ රට බෙර වාදනය ප්‍රගුණ කලේය.දවුල් හා තම්මැට්ටම් වාදනය මෙන්ම පහතරට හා සබරගමු නැටුම් පිළිබඳවද දක්ෂතා දැක්වීය.1944 වර්ෂයේදී ශිෂ්‍යත්වයක් ලැබ ඉන්දියාවේ ශාන්තිනිකේතනයට ගිය මෙතුමා භාරතීය නර්තන සම්ප්‍රදායන් පිළිබඳ හදාරා ඇත.රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ ගීත නාට්‍යවල රංගනයෙන් දායකත්වය දැක්වීමටද මෙතුමාට හැකිවිය.ගුරුවරයෙක්,කතිකාචාර්ය වරයෙකු හා රජයේ ලලිතකලා ආයතනයේ විදුහල්පති ලෙසද මෙතුමා සේවය කරන ලදී.

ගොයම් කැපීමේ නැටුම,නාරිලතා නැටුම,මොනර නැටුම හා දඩයක්කාරයාගේ නැටුම මෙන්ම කෝච්චිය,පොරපොල් පිටිය,ග්‍රහ අපලය,ගම්මානේ මල් පිපිලා හා බතේ උපත වැනි මුද්‍රා නාට්‍ය වලද ,සිකුරු තරුව,කුරුලු බැද්ද,අශෝකා වැනි සිනමාපට වල නර්තන නිර්මාණයන් මෙතුමා විසින් සිදුකරන ලදී.

පැවරුම්

1.එස්.පනීභාරත මහතාගේ සුවිශේෂී දක්ෂතා මොනවාද ?

2.මෙතුමා නර්තන කලාවට සිදුකල සේවාව පිළිබඳ විස්තර කරන්න.